**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**
**මාර්ගගත ක්‍රමය ඔස්සේ ගමන් බලපත්‍ර අයදුම්පත් භාරදීමේ ක්‍රමවේදය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් මහජනතාවට වඩාත් පහසුවෙන් විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීමට හැකිවන සේ මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීමට හැකි ක්‍රමවේදයක් 2023.06.15 දින සිට හඳුන්වාදීමට අපේක්ෂා කෙරේ.

මෙම ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සඳහා දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 51කට අනුබද්ධ, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්යාල වල පිහිටවනු ලබන ඇඟිලි සලකුණු ලබා ගැනීමේ මධ්‍යස්ථානයන්හිදී ඇඟිලි සලකුණු ලබා දීමේ අවස්ථාව උදා වේ. මෙහිදී වයස අවුරුදු 60ට වැඩි තැනැත්තන් මෙම ක්‍රමය ඔස්සේ අයදුම් කිරීමේදී ඇඟිලි සලකුණු ලබා ගැනීම අවශ්‍ය නොවන බැවින් ඔවුන් අයදුම්පත්‍රය සමඟ අදාළ ලේඛන ඉදිරිපත් කිරීම පමණක් ප්‍රමාණවත් වේ.

ඇඟිලි සලකුණු ලබා ගැනීමෙන් අනතුරුව දින 03කට පසු තැපැල් දෙපාර්තමේන්තුවේ කුරියර් සේවාවක් මඟින් අයදුම්කරු වෙත විදේශ ගමන් බලපත්‍රය යොමු කෙරෙන "හදිසි සේවය" ඔස්සේ මෙන්ම දින 14ක් තුළ අයදුම්කරු වෙත ගමන් බලපත්‍ර යොමු වෙන සාමාන්‍ය සේවය ඔස්සේද විදේශ ගමන් බලපත්‍ර නිකුත් කෙරේ.

සාමාන්‍ය සේවය යටතේ දින 14ක් තුළ තැපෑලෙන් අයදුම්කරු වෙත විදේශ ගමන් බලපත්‍රය යොමු කරනු ලැබේ.

**මාර්ගගත ක්‍රමය ඔස්සේ ගමන් බලපත්‍ර අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය**

- දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන www.immigration.gov.lk හි දක්වා ඇති "මාර්ගගත ක්‍රමය ඔස්සේ විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් භාර ගැනීම" නම් සබැඳියට පිවිස අදාල තේරීම් සිදුකල යුතුය.
- ඔබගේ ජංගම දුරකථන අංකය ඇතුළත් කිරීමෙන් පසු එයට ලැබෙන එක් වරක් භාවිතා කල හැකි මුරපදය (OTP) ඇතුළත් කල යුතුය.
- ලබා දෙනු ලබන උපදෙස් අනුව අදාළ තොරතුරු ඇතුළත් කල යුතුය.
- වෙබ් අඩවියේ සඳහන් විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීමේදී ඉදිරිපත් කල යුතු ලේඛන වල මුල් පිටපත් පරිලෝකනය (Scan) කර උපදෙස් අනුව සබැඳියට ඇතුළත් කල යුතුය.
- ඔබ විසින් තෝරාගනු ලබන ඇඟිලි සලකුණු ලබා දීමේ මධ්‍යස්ථානයේදී හා අදාළ වේලාවේදී ඇඟිලි සලකුණු ලබා දීමේ හැකියාව ඔබ වෙත ඇති අතර කෙටි පණිවුඩයක් මඟින් ඔබ වෙත ඒ බැව් තහවුරු කෙරෙනු ඇත.
- ඒ අනුව දන්වා ඇති දින අදාළ ප්‍රාදේශීය කාර්යාලයේ හැඳුනුම්පත් අංශයේ ස්ථාපිත කොට ඇති ඇඟිලි සලකුණු ලබා දීමේ මධ්‍යස්ථානයේදී ඇඟිලි සලකුණු ලබා දීම සිදු කල හැක. එහිදී ඔබගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා හැඳුනුම්පත ඉදිරිපත් කල යුතුය.
- ඔබ විසින් ඡායාරූපය ලබා ගෙන නැත්නම් ඇඟිලි සලකුණු ලබා ගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා අවස්ථාව සලසා ඇත.
- එසේ ඇඟිලි සලකුණු ලබා දීමෙන් පසු හදිසි සේවය ඔස්සේ ඉල්ලුම් කරනු ලැබූ අයදුම්කරුවන් සඳහා දින 03ක් තුල තැපැල් දෙපාර්තමේන්තුවේ කුරියර් සේවාව මඟින් විදේශ ගමන් බලපත්‍රය අයදුම්කරුගේ ලිපිනය වෙත යොමු කෙරේ.
- ඔබ සතුව වලංගු ගමන් බලපත්‍රයක් පවතී නම් ඇඟිලි සලකුණු ලබාගන්නා නිලධාරීන් වෙත එම ගමන් බලපත්‍රය ඉදිරිපත් කල යුතුය.
- අයදුම්පත පෞද්ගලිකව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඔබට යම් අපහසුතාවයක් පවතී නම් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ඡායාරූප ශාලාවකින් ඒ සඳහා සහය ලබා ගැනීමට හැකියාව ඇත.

**ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය**

- හදිසි සේවය - රු.15,000
  සාමාන්‍ය සේවය - රු.5,000
- ගෙවීම් බැංකු කාඩ්පත් මඟින් මාර්ගගත ක්‍රමය ඔස්සේ හෝ ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට හෝ සිදු කල හැක.
- ගෙවීම් කරන ක්‍රමය බැංකුව ලෙස තෝරා ගන්නේ නම්, එම තෝරා ගැනීමේදී පෙන්නුම් කරනු ලබන රිසිට් පත මුද්‍රණය කර ගෙවීම කරනු ලබන බැංකුව වෙත ඉදිරිපත් කල යුතුය.

**මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉල්ලුම්කල නොහැකි අවස්ථා**

- වලංගු විදේශ ගමන් බලපත්‍රය නැතිවූ අවස්ථාවන්හිදී
- වයස 16ට අඩු දරුවන් සඳහා විදේශ ගමන් බලපත්‍ර ඉල්ලුම් කිරීමේදී
- වෙනත් රටක උපත ලැබූ දරුවෙකු අවුරුදු 22න් පසු පළමු වරට විදේශ ගමන් බලපත්‍ර ඉල්ලුම් කිරීමේදී
- රාජකාරි හා රාජතාන්ත්‍රික ගමන් බලපත්‍ර ඉල්ලුම් කිරීමේදී

**ගමන් බලපත්‍ර අයදුම් කිරීමේදී ඉදිරිපත් කල යුතු අනෙකුත් ලේඛන**

සියළු ලේඛනවල මුල් පිටපතෙහි පරිලෝඛනය කල (Scanned) මෘදු ලේඛන ඉදිරිපත් කල යුතුය.

1. උප්පැන්න සහතිකය
2. ජාතික හැඳුනුම්පත
3. ඡායාරූපයේ ලදුපත (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණීමට පෙර ඡායාරූපය ලබා ගෙන ඇත්නම්)
4. වලංගු ගමන් බලපත්‍රයක් පවතිනම් එහි ජීව දත්ත අඩංගු පිටුවෙහි පිටපත
5. විවාහයෙන් පසු නම සංශෝධනය කරන්නේ නම් විවාහ සහතිකය
6. රැකියාව ඇතුලත් කරන්නේ නම් ඊට අදාල සේවා සහතිකය හා අධ්‍යාපනික සහතික
7. විදේශයකදී උපත ලද දරුවෙක් නම් පුරවැසි පනතේ 5(2) වගන්තිය යටතේ හෝ 11 වගන්තිය යටතේ ලියාපදිංචි සහතිකය
8. ද්විත්ව පුරවැසිභාවය හිමි අයෙක් නම් ද්විත්ව පුරවැසි සහතිකය හා පුරවැසිභාවය හිමි අනෙක් රටෙහි ගමන් බලපත්‍රයෙහි ජීව දත්ත අඩංගු පිටුවෙහි පිටපත

පූජ්‍ය පක්ෂය සඳහා

සියලුම පූජ්‍ය පක්ෂ සඳහා අදාළ රාජ්‍ය ආයතනය මඟින් නිකුත් කරන ලද පූජ්‍යත්වය සනාථ කරන ලේඛනයේ පරිලෝකනය කරන ලද පිටපත